# සැලසුම් ලේකම් කාර්යාලය, දකුණු පළාත
திட்டமிடல் செயலாளர் அலுவலகம், தென் மாகாணம்
PLANNING SECRETARIAT, SOUTHERN PROVINCE

153 බී, එස්. එච්. දහනායක මාවත, ගාල්ල, ශ්‍රී ලංකාව
153 பீ, எஸ்.எச்.தஹநாயக் மாவத்தை, காலி, ஸ்ரீ லங்கா
153B, S.H.Dahanayaka Mawatha, Galle,Sri Lanka

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්)
பிரதி பிரதம செயலாளர் (திட்டமிடல் கண்காணிப்பு)
Deputy Chief Secretary (Planning & Monitoring)

දුරකථන / தொலைபேசி / Telephone 091 -2234503
ෆැක්ස් / நகல் / Fax 091-2246554
ඊ-මේල් / மின்னஞ்சல் / E - Mail spdcsp@gmail.com


මගේ අංකය / எனது இல / My Ref. DCSP/ACC/06/01/2/6

ඔබේ අංකය / உமது இல / Your Ref.

දිනය / திகதி / Date 2025.11. 12

EWIS PERIPHERALS (PVT) LTD. 15 NOV 2025 RECEIVED (23)

කළමනාකරු,
ඊ විස් පෙරිපිලර්ස් පුද් සමාගම,
68, ගාලු පාර,
කොළඹ 03.

මහත්මයාණනි/මහත්මියනි,

<u>දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලය සඳහා වැඩ යන්ත්‍ර 09 ක් සපයා ගැනීම වෙනුවෙන් ලංසු කැඳවීම.</u>
<u>ලංසු අංකය: **SP/DCSP/SHOP/2025/10**</u>

දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලය සඳහා වැඩ යන්ත්‍ර 09 ක් සපයා ගැනීම වෙනුවෙන් වෙළඳපොල මිල සැසඳුම් ක්‍රමය යටතේ සුදුසුකම්ලත් ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | විස්තරය | ලංසු සුරක්ෂණය රු: |
|---|---|---|
| 01 | කාර්යාලය සඳහා වැඩ යන්ත්‍ර 09 ක් මිලදී ගැනීම | 12,000.00 |

02. අදාල ලංසු පත්‍රිකාව මේ සමග අමුණා යොමු කරන අතර, ලංසු ඉදිරිපත් කිරීමේ දී ඒ සමඟ රු:12,000.00 ක් වටිනා ආපසු ගෙවන ලංසු සුරක්ෂණයක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) නමින් අමුණා තිබිය යුතු වේ. එම ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ඕනෑම වාණිජ බැංකුවකින් ලබාගත් බැංකු ඇපකරයක් ලෙස හෝ සැලසුම් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශය වෙත ආපසු ගෙවන තැන්පතුවක් ලෙස මුදල් ගෙවීම මගින් ඉදිරිපත් කළ හැකි අතර, මුදල් ගෙවීමෙන් පසු ලබාදෙන මුදල් කුවිතාන්සියේ මුල් පිටපත ලංසු පත්‍රිකාව සමග ඉදිරිපත් කළ යුතුය. බැංකු ඇපකරයක් මගින් ඉදිරිපත් කරන්නේ නම් එය **2026.02.07** දින දක්වා වලංගුව පැවතිය යුතුය. චෙක්පත් හෝ බැංකු අණකර ලෙස ඉදිරිපත් කරන ලංසු ඇපකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ලංසු පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර, එම පිටපත්, මුල් පිටපත හා අනු පිටපත ලෙස නම් කර වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා, අවසානයේ එම කවර දෙකම එක් කවරයක බහා ඉදිරිපත් කළ යුතු අතර, එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසු අංකය: **SP/DCSP/SHOP/2025/10** හා **" දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලය සඳහා වැඩ යන්ත්‍ර සැපයීම -2025"** ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු මුද්‍රා තබා <u>2025 නොවැම්බර් මස 21 වැනි දින ප.ව.2.30 ට පෙර ලැබෙන සේ , නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම් ), දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලය, අංක:153 බී, එස්.එච්.දහනායක මාවත, ගාල්ල</u> යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අතින් ගෙනවිත් භාර දෙන්නේ නම් සැලසුම් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් අනතුරුව, එම ස්ථානයේ තබා ඇති ලේඛනයේ ද සටහන් කළ යුතුය.

06. ලංසු විවෘත කිරීම 2025 නොවැම්බර් මස 21 වැනි දින ප.ව.2.30 ට සැලසුම් ලේකම් කාර්යාලයේ දී සිදු කරන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ/ඇයගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

<u>ප්‍රමාද වී ලැබෙන ලංසුපත් සහ විකල්ප ලංසු ඉදිරිපත් කර ඇති ලංසු පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>